# ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

தேசிய மொழிக்கல்வி மற்றும் பயிற்சி நிறுவனம்

**National Institute of Language Education and Training**

NILET

## ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ පුරප්පාඩු වී ඇති සම්බන්ධීකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

සම්බන්ධීකරණ සහකාර තනතුර (තාවකාලික පදනම මත වසරක කාලයක් සඳහා බඳවා ගැනීම)

**1. කාර්යයන්**

2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනත මගින් ආයතනය වෙත පැවරී ඇති කාර්යයන් හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා දිවයින පුරා භාෂා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, එම වැඩ සටහන් සම්බන්ධීකරණය කිරීම සහ පසු විපරම් කිරීම.

**2. පත්වීමේ ස්වභාවය**

පුරප්පාඩු තනතුරු දෙකකි. මෙම පත්වීම තාවකාලිකය. වසරක කාලයක් සඳහා බඳවා ගැනේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායකත්වය හිමිවේ.

**3. වැටුප**

MA - 3 ක්‍රමය යටතේ මූලික වැටුප සමග රජයේ අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

**4. අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**4.1 අමතර සුදුසුකම්**

I. තනතුරට බඳවා ගනු ලැබූ මාධ්‍යයට අමතරව සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඉහළ ප්‍රවීණතාවයක් ලබා තිබීම.

II. තොරතුරු තාක්ෂණය පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම.

**5. වයස**

අවුරුදු 21ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතුය.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු පිළිවෙල**

ජීවදත්ත විස්තර හා ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, දුරකථන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය සහ තැපැල් ලිපිනය ඇතුළත් තමන් විසින් සකස් කළ අයදුම් පත්‍රය, අධ්‍යාපන / වෘත්තීය සහතික පිටපත් සමග 2024.10.14 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය**
**නො 321/1A, හයිලෙවල් පාර, මාකුඹුර,**
**පන්නිපිටිය.**